**සිංහල භාෂා අංශය**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය**

**11 ශ්‍රේණිය** | **සාහිත්‍ය දැනුම මිනුම**
**කාලය පැය 01 යි.**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) පහත දී ඇති පාඨ (අ) උපුටා ගත් පාඩමේ නම, (ආ) කීවේ කවුරු විසින්ද? (ඉ) කීවේ කවරෙකු හටද? (ඊ) කුමන අවස්ථාවක දීද ? යන්න දක්වන්න.

I. "ශිල්පයට උපචාර නොකරන්නා ඵල නොදෙයි"
(අ) ...............................................................................
(ආ) ...............................................................................
(ඉ) ...............................................................................
(ඊ) ...............................................................................

II. "තෝ දියෙන් යන්නෙහි මුට කුමක් කී දැ?"
(අ) ...............................................................................
(ආ) ...............................................................................
(ඉ) ...............................................................................
(ඊ) ...............................................................................

III. "හිර ගෙදරින් අහපුවාම උබට දැනගන්ඩ පුළුවන් වෙයි"
(අ) ...............................................................................
(ආ) ...............................................................................
(ඉ) ...............................................................................
(ඊ) ...............................................................................

( 4 * 3 = 12 )

2) පහත දැක්වෙන පද්‍ය සම්පූර්ණ කරන්න.

i. සුන් එ තනින් එ සඳ
පසු කැර සුරන් වෙණ නද
................................................
................................................

ii. ................................................
................................................
කඩුල්ලේ තරම දැනගෙන කද බදිනු
තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු

( 2 * 2 = 4 )

3) පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i ‘‘අමා වතුර‘‘ ග්‍රන්ථය සදහා මුල් වූ බුදු ගුණය නම් කරන්න.

...........................................................................................................................

ii ලෙනාඩ් වුල්ෆ් මහතාගේ බිරිදගේ නම කුමක්ද?

...........................................................................................................................

iii මළගිය ඇත්තෝ සහ මලවුන්ගේ අවුරුදු දා යන නව කතාවන් හි රචකයා නම් කරන්න.

..........................................................................................................

iv වැත්තෑවේ හිමිට ගුත්තිල කාව්‍ය රචනා කරන ලෙස ආරාධනා කරන ලද්දේ කවුරුන්ද?

…………………………………………………………………..

( 1 * 4 = 4 )

4) පහත සදහන් පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පුත නුඹ වඩාගෙන මම ඉස්සර දිනෙක
ගමනක මහන්සි ය හැර ගන්නට රැයෙක
නැවතුණු මෙතැන මේ ගස හොද හැටි මතක
මෙතැනට මාව ගෙන ඒම ම පුදුමයෙක

ඉතින් පුතේ නුඹ බිහි වූ දිනේ සිට
ඇතින්නියකගේ හදකින් ලද පෙමට
ගිහින් එම් කියාවත් නොකියා යන විට
ඇගෙන් පලා හැලුණා හදවත බිමට

i මව තුල ශෝකය වඩාත් දැනවීමට හේතුව සදහන් කරන්න.

ii මවගේ සිතෙහි පුදුමය දැනවීමට හේතුව කුමක්ද?

iii “ඇගෙන් පලා හැලුණා හදවත බිමට‘‘ යන කාව්‍යෝක්තිය මගින් ප්‍රකාශ වන අදහස ඔබේ වචනයෙන් ලියන්න.

( 2 * 3 = 6 )

5) පහත සදහන් යෙදුම් වල ඇත් සාහිත්‍යමය ගුණය වඩාත් ඉස්මතු වන වරණය වරහන් තුළින් තොරා ලියන්න.
(රූපකාලංකරණය , ස්භාවොක්තිය , උපමාලංකරණය)

i දර ටික බිම තබා සෙවණැති පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල සිට .........................................................

ii කවදා කොතැනකදි හෝ මහ මුහුද හිමි
හමුවුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි .........................................................

iii එක් උනදාට උක් දණ්ඩේ පැණි සේම
වෙන් උනදාට ඔක් දෙබරේ මද සේම .........................................................

( 1 * 3 = 3 )

6) පහත සදහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණු ද වැරදි නම් (x) ලකුණු ද ඉදිරියෙන් දී ඇති කොටුව තුළ යොදන්න.

i "අසන් පත්තින් දේවතාවී " යනු මොනිකා රුවන් පතිරණ ලියූ කාව්‍ය සංග්‍රහයකි. (............)

ii "අතිශයෝක්තිය" යනු යම් වස්තුවක ස්වභාවය ඉක්මවා පැවසීමය (..............)

iii සම්භාව්‍ය සිංහල සන්දේශ අතුරෙන් වැඩි ප්‍රමාණයත්රචනා වූයේ කෝට්ටේ අවදියේදීය (..............)

( 1 * 3 = 3 )

7) පහත දී ඇති සාහිත්‍ය සම්බන්ධ වචන කෙටියෙන් පැහැදලි කරන්න.

i ප්‍රතිභාව

ii ව්‍යංග්‍යාර්ථ

iii සහෘදයා

( 1 * 3 = 3 )

8) පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා එහි ඇතුළත් සමස්ථ අදහස ගැන සැලක්ල්ල යොමුකර එය පිළිබඳ ඔබගේ සිතට නැගෙන හැඟීම් සංක්ෂිප්තව ලියන්න.

අපේ අම්මා දුම්මල ගලවන්න ගියා
ඒවා මිටි බැඳන් වදුරඹ පොලට ගියා
හාල් ටිකට පොල් ගෙඩියට ණයක් තියා
කොපි පොතකුයි පැන්සලකුයි නියා

වැහි වැහැලා ගල ආදා බඩේ වුණා
අම්මා එදත් ඒ ගල මුදුනටම උනා
රූටා ගිහිං පාමුල ගලටත් රිදුනා
අම්මා තිව් විලාපය තවමත් ඇසෙනා

( ලකුණු 5 )

9) "උවදුරකට පැමිණිය වුන්ට පිහිට විය යුතුය යන පරමාදර්ශී ගුණය මහෞෂධ චරිතයෙන් විදහා දැක්වේ." සකර කන් මන්ත්‍රණය පාඩම ඇසුරෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 5 )

10) "ගංගාවේ සංගීතය" පද පන්තිය තුළින් කවියා ඉදිරිපත් කරන ජීවන දර්ශනය පැහැදිලි කරන්න.

( ලකුණු 5 )

පිළිතුරු

සිංහල භාෂාව සාහිත්‍යය තරඟාවලිය 2023

11 ශ්‍රේණිය කාලය පැය 01

1. I (අ) අගුල්මල් දමනය
(ආ) දිසාපාමොක් ඇදුරුතුමා / තක්ෂිලා නුවර ගුරුතුමා / ගුරුතුමා
(ඉ) අහිංසකකම
(ඊ) ගුරු පූජාව සඳහා මිනිසුන් දහසක් මැරීය යුතු යැයි පැවසූ අවස්ථාව

II (අ) සතර කන්මන්ත්‍රණය
(ආ) තලතා දේවිය
(ඉ) ගඟෙන් එගොඩ යාමට ආ පුද්ගලයාට / සහල් නැළිය , රන් මසු හා මසුරන් දහස සතු පුද්ගලයාට
(ඊ) ගඟෙන් එගොඩ යාමට නොහැකිව සිටි පුද්ගලයා / ගඟෙන් එගොඩ යාමට ඔහු එගොඩ කෙරූ පුදුගලයා / තමන් කැමති දේ ඉල්ලූ විට ඇති වූ ප්‍රශ්නය තලතා දේවිය විසඳූ අවස්ථාව හා සම්බන්ධවයි

III (අ) බැද්දේගම
(ආ) වෙදරාළ / පුංචිරාල / ගම්මුලාදෑනිය
(ඉ) පුංචි මැණිකාට
(ඊ) බබුන් හිරේදී මළ බව වෙද රාළ පුංචි මැණිකාට පැවසූ අවස්ථාවේ පුංචි මැණිකා එය ස්ථිරව දැන ගැනීමට නැවත බබුන් මළ බව තහවුරු කරගන්නා අවස්ථාව

2. I දියුණු දියුණු ව නද
නික්ම පැතිරෙන දසත විනිවිද

II ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු

3. I පුරිස ධම්ම සාරථී ගුණය
II ඇඩ්ලින් වර්ජනියා ස්ටෙෆන්
III මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
IV සලාවත ජයපාල මැතිඳුන්

4. I “ගිහින් එන්නම්” කියාවත් නොකියා යාම
II දිනක් මහන්සිය නිවා ගනිමින් රයක් ගත කල ස්ථානයටම රැගෙන ඒම
III ගැළපෙන පිළිතුරට ලකුණු ලබා දෙන්න (තමන්ගේ සිත ගත සසල වූ අවස්ථාවක් වැනි)

5. I ස්භාවොක්තිය
II රූපකාලංකාරය / රූපක
III උපමාලංකාරය / උපමා

6. I x

II √

III √

7. I අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව
II ඇති තතු ඉක්මවා වැටහෙන තොරතුරු සහිත නිර්මාණ
III සමාන හදවතක් ඇති පුද්ගලයා (නිර්මාණකරු ප්‍රකාශ කරන අදහසට සමාන අදහසක් ඇති කරගන්නා පුද්ගලයා)

8, 9, 10 ලබා දී ඇති තොරතුරු අනුව ලකුණු ප්‍රදානය කරන්න.